# 7 ශ්‍රේණිය



# ගණිතය

Start Your Learning Journey with e-thaksalawa

The National e-learning Portal for The General Education

# දත්ත නිරූපණය

## 29 පාඩම

- අමා වනෝද්‍යානයකදී දුටු සතුන් කිහිපදෙනෙකු පිළිබඳ තොරතුරු පහත චිත්‍ර ප්‍රස්ථාරය මගින් දැක්වේ.





එක් රූපයකින් එක සතෙකු නිරූපණය වේ.

**ඉහත චිත්‍ර ප්‍රස්තාරය මගින් පහත දැක්වෙන ආකාරයට තොරතුරු ඉදිරිපත් කළ හැකිය .**

1. ඇය දුටු අලින් ගණන 5 ක් වේ.
2. වැඩියෙන්ම ඇය දුටුවේ අලින් වේ.
3. ඇය දුටු සතුන් සංඛ්‍යාවේ එකතුව 12 ක් වේ.
4. අමා දුටු කොටින් සහ අලින් සංඛ්‍යාවේ එකතුව 6 කි.
5. ඇය දුටු කොටි හා අලි ගණනේ වෙනස 4 කි.

`




අන්තර්ගතය -: ගීතා ජානකී, නිව්ස්ටෙඩ් බාලිකා විද්‍යාලය - මීගමුව

සැකසුම -: එස්.ඩබ්.ඩී.ආර්.නයනතරා ද සිල්වා, අම්/ බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල
Copyright © www.e-thaksalawa.moe.gov.lk


## තීර ප්‍රස්තාර

- මෙවැනි අවස්ථා වලදී තොරතුරු නිරූපණය කිරීම සඳහා දී ඇති තොරතරු වල ප්‍රමාණ සෘජුකෝණාස්‍රාකාර තීරුවලින් නිරූපණය කරනු ලබයි.

ඉහත චිත්‍ර ප්‍රස්තාරයේ නිරූපණය කර ඇති තොරතුරු තීර ප්‍රස්තාරයක නිරූපණය කර ඇති ආකාරය පහත දැක්වේ.




ඉහත තීර ප්‍රස්තාරය මෙසේ ද නිරූපණය කළ හැකිය. මෙහිදී තිරස් අතට ඇඳි තීර සිරස් අතට දක්වයි.






අන්තර්ගතය -: ගීතා ජානකී, නිව්ස්ටෙඩ් බාලිකා විද්‍යාලය - මීගමුව

සැකසුම -: එස්.ඩබ්.ඩී.ආර්.නයනතරා ද සිල්වා, අම්/ බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල

Copyright © www.e-thaksalawa.moe.gov.lk


තීර ප්‍රස්තාරයක තීර,

- සෘජුකෝණාස්‍ර හැඩවලින් යුක්තයි.
- ඒවා තිරස් හෝ සිරස් වේ.
- ඒවා එකිනෙක ස්පර්ශ නොවී පිහිටිය යුතුය.
- තීරවල පළල එක සමාන වේ.
- තීර අතර පරතරය සමාන වේ.

උදාහරණ:-

අමා වනෝද්‍යානය නැරඹීමට ගිය විට එහි රිය ගාලේ නවතා තිබූ වාහන සංඛ්‍යා පිළිබඳ තොරතුරු ඇය පහත වගුවේ පරිදි සටහන් කරන ලදී.

| වාහන වර්ගය | වාහන සංඛ්‍යාව |
|---|---|
| බස් | 40 |
| වෑන් | 80 |
| කාර් | 50 |
| වෙනත් | 60 |






අන්තර්ගතය -: ගීතා ජානකී, නිව්ස්ටෙඩ් බාලිකා විද්‍යාලය - මීගමුව
සැකසුම -: එස්.ඩබ්.ඩී.ආර්.නයනතරා ද සිල්වා, අම්/ බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

අභ්‍යාසය 1

එක් දිනක වනෝද්‍යානය නැරඹූ පුද්ගලයන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ ආකාරය පිළිබඳ තොරතුරු පහත වගුවේ දැක්වේ. එම තොරතුරු තීර ප්‍රස්තාරයක නිරූපණය කරන්න.

| නරබන්නන් කාණ්ඩය | සංඛ්‍යාව |
|---|---|
| ළමයි | 25 |
| තරුණ | 30 |
| වැඩිහිටි | 40 |
| විදේශිකයන් | 30 |

## බහු තීර ප්‍රස්තාර

එක් වර්ගයක තොරතුරු එකකට වැඩියෙන් ඇති විට ඒවා එක් තීරයකින් පමණක් දැක්විය නොහැකිය. එවිට ඒ සඳහා බහු තීර ප්‍රස්තාර යොදා ගන්නා ආකාරය අපි දැන් ඉගෙන ගනිමු.

නිදසුන

අමා පසුගිය වසරේ දුටු සතුන් සහ මෙවර දුටු සතුන් සංඛ්‍යා පහත වගුවේ පරිදි සටහන් කර ගන්න ලදී.එම තොරතුරු බහුතීර ප්‍රස්තාරයක නිරූපණය කර ඇති ආකාරය පහත දැක්වේ.


| වර්ගය | 2019 | 2020 |
|---|---|---|
| අලි | 7 | 5 |
| මුවන් | 15 | 4 |
| කොටි | 2 | 1 |
| මොනරු | 12 | 2 |



අන්තර්ගතය -: ගීතා ජානකී, නිව්ස්ටෙඩ් බාලිකා විද්‍යාලය - මීගමුව

සැකසුම -: එස්.ඩබ්.ඩී.ආර්.නයනතරා ද සිල්වා, අම්/ බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

බහු තීර ප්‍රස්තාරය ඇඳීමේ දී 2019 වර්ශය සඳහා ▬ ද , 2020 වර්ශය සඳහා ▭ ද යොදා ගෙන ඇතිබව ප්‍රස්තාරයේ පහළ සඳහන් කොට ඇති යතුරෙහි දැක්වේ.




අභ්‍යාසය 2

1.) ශ්‍රී ලංකාවේ පසුගිය දින පහක් තුළ කොරෝනා ආසාදිත වූ රෝගීන් සංඛ්‍යාව සහ රෝගය සුව වූ රෝගීන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ. එම තොරතුරු බහු තීර ප්‍රස්තාරයක නිරූපණය කරන්න.

| දවස | ආසදිත සංඛ්‍යාව | සුව වූ සංඛ්‍යාව |
|---|---|---|
| සඳුදා | 350 | 300 |
| අඟහරුවාදා | 400 | 250 |
| බදාදා | 300 | 200 |
| බ්‍රහස්පතින්දා | 275 | 300 |
| සිකුරාදා | 250 | 350 |



අන්තර්ගතය -: ගීතා ජානකී, නිව්ස්ටෙඩ් බාලිකා විද්‍යාලය - මීගමුව
සැකසුම -: එස්.ඩබ්.ඩී.ආර්.නයනතරා ද සිල්වා, අම්/ බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

2.) සදලි ප්‍රධාන විෂයන් හතරක් සඳහා වාර පරික්ෂණ දෙකකදී ලබාගත් ලකුණු පහත දැක්වේ.එම තොරතුරු බහු තීර ප්‍රස්තාරයක නිරූපණය කරන්න.


| විෂය | පළමු වාරය | දෙවන වාරය |
|---|---|---|
| විද්‍යාව | 80 | 85 |
| ගණිතය | 60 | 80 |
| සිංහල | 70 | 95 |
| ඉංග්‍රීසි | 55 | 60 |

## දත්ත අර්තකථනය

- **තීර ප්‍රස්තාරවල සහ බහු තීර ප්‍රස්තාරවල නිරූපණය කර ඇති දත්ත ඇසුරෙන් විවිධ තොරතුරු ලබා ගනිමු.**

**නිදසුන 1 -**

**ශ්‍රී ලංකාවේ පසුගිය දින 5ක් තුළ කොරෝනා ආසාධිත රෝගීන් සංඛ්‍යාව දැක්වෙන තීර ප්‍රස්තාරයක් පහත දැක්වේ. ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**







අන්තර්ගතය -: ගීතා ජානකී, නිව්ස්ටෙඩ් බාලිකා විද්‍යාලය - මීගමුව

සැකසුම -: එස්.ඩබ්.ඩී.ආර්.නයනතරා ද සිල්වා, අම්/ බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල


Copyright © www.e-thaksalawa.moe.gov.lk

1)වැඩිම ආසාදිතයින් ගණනක් වාර්තා වූ දිනය කුමක්ද? බ්‍රහස්පතින්දා


2)අඩුම ආසාදිතයින් ගණනක් වාර්තා වූ දිනය කුමක්ද?අගහරුවාදා

3) වැඩිම සහ අඩුම ආසාදිතයින් අතර වෙනස කොපමණද? 350-175=175

අභ්‍යාසය 3

පහත සදහන් තීර ප්‍රස්තාර ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. මාස කිහිපයක එක් පවුලක වියදම් දැක්වෙන තීර ප්‍රස්තාරයක් රූපයේ දැක්වේ.





1. වැඩිම වියදමක් දැක්වෙන මාසය කුමක්ද?
2. අඩුම වියදමක් දැක්වෙන මාසය කුමක්ද?
3. ජනවාරි මාසයට වඩා අප්‍රේල් මාසයේ වියදම කොපමණ වැඩි වී තිබේද?
4. වැඩිම වියදමක් දැක්වෙන මාසයේ වියදම, අනෙක් මාසවලට වඩා වැඩි වීමට බලපාන්නට ඇතැයි අපේක්ෂා කළ හැකි හේතු දෙකක් සදහන් කරන්න.



අන්තර්ගතය -: ගීතා ජානකී, නිව්ස්ටෙඩ් බාලිකා විද්‍යාලය - මීගමුව

සැකසුම -: එස්.ඩබ්.ඩී.ආර්.නයනතරා ද සිල්වා, අම්/ බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල
Copyright © www.e-thaksalawa.moe.gov.lk

2. වාහන නිශ්පාදනය කරන ආයතනයක් නිශ්පාදනය කරනලද වාහන සංඛ්‍යාව සහ අලෙවි කරන ලද වාහන සංඛ්‍යාව පිළිබද තොරතුරු පහත බහු තීර ප්‍රස්තාරය මගින් දැක්වේ. එමගින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න




1)නිශ්පාදනය කළ වාහන වලින් සියල්ලම අලෙවි වී ඇති වාහන වර්ගය කුමක්ද?

2)කාර් කොපමණ සංඛ්‍යාවක් අලෙවි නොවී ඉතිරි වී තිබේද?

3) නිශ්පාදනය කළ මුළු වාහන සංඛ්‍යාව කොපමණද?

4)මෝටර් සයිකල් අලෙවිය වැඩිවීමට බලපා ඇතැයි අපේක්ෂා කළ හැකි හේතු දෙකක් සඳහන් කරන්න.

පෙළපොතෙහි පහත අභ්‍යාසයද සිදු කරන්න.

26.1



අන්තර්ගතය -: ගීතා ජානකී, නිව්ස්ටෙඩ් බාලිකා විද්‍යාලය - මීගමුව

සැකසුම -: එස්.ඩබ්.ඩී.ආර්.නයනතරා ද සිල්වා, අම්/ බණ්ඩාරනායක බාලිකා ජාතික පාසල
Copyright © www.e-thaksalawa.moe.gov.lk